# ජාතික ක්‍රීඩා අරමුදල - 2012

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ජාතික ක්‍රීඩා අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාර්ත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

#### 1.2.1 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පහත සඳහන් අවස්ථාවලදී අදාල කාරණය සඳහා මුදල් යෙදවූ බවට සහතිකයක් හෝ වියදම් විස්තරයක් ලබා ගෙන නොතිබුණි.

| ක්‍රීඩා සංගමය | ගෙවීම් විස්තරය | මුදල<br>රු. |
|---|---|---|
| පාපන්දු සම්මේලනය | මහින්ද රාජපක්ෂ පාපන්දු තරඟාවලිය | 3,202,250 |
| ශ්‍රී.ල රග්බි පාපන්දු සංගමය | ජාත්‍යන්තර භෞත චිකිත්සකවරයකුගේ සේවය ලබා ගැනීම වෙනුවෙන් | 1,250,000 |
| මලල ක්‍රීඩා සංගමය | භෝජන සංග්‍රහය | 750,000 |

(ආ) අරමුදල මගින් 2012 මාර්තු 14 දින ශ්‍රී ලංකා නෙට්බොල් සංගමය වෙත රු. 800,000 ක් ගෙවා තිබුණත් ඒ සඳහා ලදුපතක් ලබාගෙන නොතිබුණි.

(ඇ) ක්‍රීඩා අරමුදල මගින් ලබා දී තිබ පහත සඳහන් අත්තිකාරම් වෙනුවෙන් අත්තිකාරම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

| විස්තරය | අත්තිකාරම් මුදල<br>රු. |
|---|---|
| දැයට කිරුළ වොලිබෝල් තරඟාවලිය | 10,000 |
| දැයට කිරුළ පාපැදි තරඟය | 20,000 |
| දැයට කිරුළ පාපැදි තරඟය | 20,000 |

(ඈ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 මාර්ගෝපදේශය ප්‍රකාරව මිළ ගණන් කැඳවීමකින් තොරව, 2012 දෙසැම්බර් 09 දින රු.164,000 ක් වටිනා ක්‍රිකට් ජර්සි කිට් 40 ක් අරමුදල විසින් පෞද්ගලික ආයතනයකින් මිළදී ගෙන තිබුණි. එහෙත් අදාල ක්‍රිකට් ජර්සි මිලදී ගැනීමේ අරමුණ හා අදාළ භාණ්ඩ බෙදාහැරීමට /නිකුත් කිරීමට අදාල විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඉ) දැයට කිරුළ ප්‍රදර්ශනයට සමගාමීව පවත්වන ලද කබඩි තරගාවලිය සඳහා අරමුදල මගින් ශ්‍රී ලංකා කබඩි සම්මේලනය වෙත රු 1,500,000 ක මුදලක් ලබා දී තිබුණු අතර, කබඩි සම්මේලෙනයේ ගිණුම් වාර්තාවලට අනුව වැයකර ඇති වියදම රු. 1,025,000 ක් විය. එහෙත් ඊට අදාල වියදම් විස්තරයක්, ලදුපත් හා ඉතිරි මුදල් ලබා ගැනීමට අරමුදල ක්‍රියාකර නොතිබුණි.

(ඊ) දැයට කිරුළ සංවර්ධන ප්‍රදර්ශනය සඳහා ක්‍රීඩා සංගම් 04 ක් සඳහා රු. මිලියනය බැගින් ලබා දී තිබුණි. එම මුදල් ලබා දීමේදී ඒ සඳහා වියදම් ඇස්තමේන්තුවක් අදාළ සංගම්වලින් හා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලබාගෙන නොතිබුණි. තවද අදාල කාරණය සඳහා මුදල් යෙදවූ බවට සහතිකයක් හෝ වියදම් විස්තරයක් ලබා ගෙන නොතිබුණි.

## 1.2.2 නීති ,රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලටඅනුකුල නොවීම

1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 25(2) වගන්තය ප්‍රකාරව එක් එක් ලිත් වර්ෂය ඉකුත් වු පසු හැකිතාක් ඉක්මනින් අරමුදලේ පර්පාලනය පිළිබඳ වාර්තාවක් අමාත්‍යාංශයේ ලේකම් විසින් පිළියෙල කළ යුතු වුවත් එවැනි වාර්තාවක් පිළියෙල කර නොතිබුණි.

## 2. මුල්‍ය සමාලෝචනය

## 2.1 මුල්‍ය ප්‍රතිඵල

ඉදර්පත් කරන ලද මුල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ අරමුදලේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.19,923,798ක අතිරික්තයක් වු අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,104,303 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂයේ ආදායමේ රු. 9,156,061 ක වර්ධනය හා වියදමේ රු. 9,663,434 ක අඩුවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මුල්‍ය ප්‍රතිඵලයෙහි රු. 18,819,495 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

## 3 මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කාර්යසාධනය

ශ්‍රී ලංකාවේ ක්‍රීඩාවලට ධෛර්ය දීම, දියුණු කිරීම හා සංවර්ධනය කිරීම අරමුදලේ ප්‍රධාන අරමුණු වුවත්, ඒ සඳහා සංයුක්ත සැලැස්මක් සහ වාර්ෂික ක්‍රියාකාර සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි. ක්‍රීඩා සමාජ සහ පුද්ගලයින් විසින් ක්‍රීඩා කටයුත්තක් සඳහා කරනු ලබන ඉල්ලීමක් අනුව යම් මුදලක් ලබාදීමට පමණක් දැනට අරමුදලේ කාර්යභාරය සීමාවී ඇති බව නිරීක්ෂණය විය.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

වර්ෂය පුරා රුපියල් මිලියන 03 කට අධික මුදල් ඵලදායි ආයෝජන මාර්ගයක ආයෝජනය කිරීමකින් තොරව ජංගම ගිණුමේ රඳවා ගෙන තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අයවැය ලේඛනමය පාලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

(අ) ක්‍රීඩා අරමුදලේ 2012 වර්ෂයට අදාල අයවැය 2011 දෙසැම්බර් 20 දින අනුමත කරගෙන තිබුණද සංශෝධිත අයවැය අනුමත කර තිබුණේ 2012 දෙසැම්බර් 28 දින දීය.

(ආ) අයවැය පිළියෙල කිරීමේදී දැයට කිරුළ සංවර්ධන ප්‍රදර්ශනය වෙනුවෙන් ප්‍රතිපාදන සළසා නොතිබුණි.

(ඇ) අයවැයගත වියදම් සහ තථ්‍ය වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූ හෙයින් අයවැය ඵලදායි කළමණාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණ විය.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) අයවැය පාලනය

(ආ) අරමුදල් උපයෝජනය